## අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 307.

සියළුම දිසා විනිශ්චයකාරවරුන්,

මහේස්ත්‍රාත්වරුන් සහ

ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරුන් වෙත,

## වැඩ බැලීමේ නීතිඥ මණ්ඩලය

දිවයිනේ සියළුම අධිකරණයන්හි වැඩ බැලීමේ නීතිඥ මණ්ඩලයන් නැවත ප්‍රතිශ්ඨාපනය කිරීමටත් ඒ අනුව, පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කිරීමටත් අධිකරණ සේවා කොමිෂන් සභාව තිරණය කර ඇත.

(1) 2007.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි දිවයිනේ සියළුම අධිකරණයන්හි එදින වන විට අනුමත වැඩ බැලීමේ නීතිඥ මණ්ඩලයන් විසුරුවා හැරේ.

(2) 2008.01.01 දින සිට බලාත්මක වනුයේ එදින සිට බලපැවැත්වෙන සේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වැඩ බැලීමේ නීතිඥ මණ්ඩලයන් වේ.

(3) වහාම ක්‍රියාත්මක වන පරිදි මින් ඉදිරියේදී අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වැඩ බැලීමේ නීතිඥ මණ්ඩලයන් සඳහා කෙරෙන අනුමත කිරීම් උපරිම එක් අවුරුද්දක කාලයකට පමණක් සීමා වේ.

(4) යම් අධිකරණයක වැඩ බැලීමේ නීතිඥ මණ්ඩල සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙනුයේ, එම අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ නිර්දේශය මත වන අතර, නිර්දේශ කරනු ලබන නීතිඥවරුන්ගේ වැඩ බැලීමේ අධිකරණ කටයුතුවල යෙදීමේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් සහ ඒ සඳහා ඉදිරිපත් වීම පිළිබඳවද, නිර්දේශ කළ විනිශ්චයකාරවරයා වගකීම භාරගත යුතු වේ.

(5) ජ්‍යෙෂ්ඨත්වය, කීර්තිනාමය, ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව, අධිකරණ බල ප්‍රදේශය තුළ පදිංචිව සිටීම සහ අවශ්‍ය අවස්ථාවන්හි සේවයේ නිරත කර ගැනීමට හැකි වීම යන කරුණු වැඩ බැලීමේ නීතිඥ මණ්ඩලයට නිර්දේශයන් ලබා දීමේදී සැලකිල්ලට ගත යුතු වේ.

(6) දිසා විනිශ්චයකාරවරයා / මහේස්ත්‍රාත්වරයා / ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයා වශයෙන් වැඩ බැලීමේ යෙදෙන දිනයන්හිදී නීතිඥ වෘත්තියේ කටයුතුවල යෙදෙමින්, සේවා දායකයින් මුණ ගැසීම සහ ගාස්තු අය කිරීමෙහි නොයෙදෙන බවට දිවුරුම් ප්‍රකාශයක් වැඩ බැලීමේ යෙදෙන නීතිඥවරුන් වෙතින් ලබාගත යුතුය.

(7) 2008.01.01 දින සිට බලපැවැත්වෙන වැඩ බැලීමේ නීතිඥ මණ්ඩල අනුමත කරවා ගැනීම සඳහා පහත සඳහන් විස්තර 2007.08.31 දිනට පෙර මෙම කාර්යාලයට ඉදිරිපත් කිරීමට පියවර ගන්න.

(අ) ඔබ අධිකරණයේ පූර්ණ කාලීනව නීතිඥ වෘත්තියේ යෙදී සිටින නීතිඥවරුන්ගේ නාම ලේඛනය (ජ්‍යෙෂ්ඨත්වයට අනුව, නීතිඥ වෘත්තියට ඇතුලත් වූ දිනය සහිතව)

(ආ) අධිකරණ කලාපය තුළ පදිංචි වී සිටින නීතිඥවරුන්ගේ නම් සහ ලිපිනයන්.

(ඇ) වැඩ බැලීමේ නීතිඥ මණ්ඩලයට ඇතුළු වීමට කැමැත්ත පළ කරන ලද නීතිඥවරුන්ගේ නම් සහ ලිපිනයන්.

(ඈ) ඔබ විසින් නිර්දේශ කරනු ලබන නීතිඥවරුන්ගේ නම් සහ ලිපිනයන්.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

පී. ඩබ්. ඩී. සී. ජයතිලක
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

2007 ජූනි මස 11 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.